## 1.3. - පන් නෙලීමේ/ගොයම් කැපීමේ නැටුම නිර්මාණය කරමු.

නිපුණතා මට්ටම -: ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි.

ගැමි නැටුම් හැඳින්වීම

අපේ මුතුන් මිත්තන් තමන්ගේ ජීවන වෘත්තීන් වල නියැලෙන විට දැනුණු නොයෙක් දුක් වේදනා ප්‍රකාශ කළේ කවියෙනි.ඒවා ලියවී ඇත්තේ ගැමි ඇදහිලි හා විශ්වාස,විනෝදාස්වාදය මෙන්ම රසවින්දනය පදනම් කරගෙනය.ගැමි නැටුම් මඟින් එකී රටේ ජනතාවගේ භාෂාව,ආගම,සිරිත් විරිත්,ඇඳුම් පැළඳුම්,ජීවන වෘත්තීන්,කෙළි සෙල්ලම් ආදී සියළුම අංග නිරූපණය වෙයි.පසු කලෙකදී ගැමි වෘත්තීන් වල නියලෙන විට චලන ද නිර්මාණය කොට ගෙන ඇත.ගැමි කවිය හා නැටුම එක්තැන් වූ කල ගැමි නැටුම බිහි වී තිබේ.

ගැමි නැටුම් වල සුවිශේෂ ලක්ෂණ :- ඔබ ගැමි නැටුම් පිළිබඳ 6, ශ්‍රේණියේ සිට ඉගෙන ගත්තා මතක ඇති. එහි ඇති සුවිශේෂ ලක්ෂණ ලෙස පහත කරුණු ඉගෙන ගන්නට ඇති.

- සරල බව
- සාමූහික බව
- උපකරණ භාවිත කිරීම
- ගායනය සහිත වීම
- එම කම
- විනෝදාස්වාදය

9 ශ්‍රේණියේ දී ඔබට පන් නෙලීම හා ගොයම් කැපීමේ නැටුම පිළිබඳ ඉගෙන ගත හැකිය.

පන් නෙලීම





ගැමියා තම ජීවිතයට අවශ්‍ය දෑ නිර්මාණය කර ගත්තේ තමා ජීවත් වූ පරිසරයෙන් සපයා ගත් අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමිනි.ගෙදර දොර කටයුතු සඳහා අවශ්‍ය වූ මලු, පැදුරු, වට්ටි, පෙට්ටි, ඇතුල්පත්,හැඳිවලු ආදී දේ පමණක් නොව කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වූ මාගල්, වී මලු ආදිය ද සකස් කර ගත්තේ ජලාශ්‍රිතව වැඩුනු බොරු පන් , පොතු පන් , තුන්හිරියා , හැවනි පන් , ගල්ලැහැ වැනි පන් වර්ග භාවිත කරමිනි.මෙහිදී පන් උදුරා ගැනීමට හෝ කපා ගැනීමට **පන් කැත්ත** නමින් හඳුන්වනු ලබන වක් නොවූ දෑකැත්තට සමාන උපකරණයක් භාවිත කළේය. පහතරට ශාන්ති කර්ම වලදී පැදුරේ උපත පිළිබඳව කියවෙන කවි ගායනා දක්නට ලැබෙන අතර උඩරට සොකරි නාටකයෙහි එක් අවස්ථාවක් ලෙස පන් නෙලීම දැක්විය හැකිය.

ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මුහුණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිනිවන් පන් තිබෙන කොට
නෑනෙ නුඹත් එනවද පන් කපන්න්ට

කොනින් කොනට පන් උදුරා ගන්නේ
තැනින් තැනට පන් අහුරු දමන්නේ
අනුන්ගෙ පන් කොළ එක් නොකරන්නේ
බැණුන් අහන්නට වෙයි දැන ගන්නේ

ඉරසඳ පාන විල කොතැනද තුන්හිරියා
ඉරසඳ පාන විල මෙතනයි තුන්හිරියා
පන්කම් කරන අඟනෝ කාටත් සරියා
මට පැදුරකට පන් දෙනවද තුන්හිරියා

කොතන විලේදෝ එපන් තිබෙන්නේ
නාගර පන් විල එපන් තිබෙන්නේ
එපන් ගෙනෙන්නට කවුදැයි යන්නේ
අඟනෝ එකතුව එතැනට යන්නේ

දුවේ පුතේ පන් නෙලීමේ නර්තනයක් නිර්මාණය කිරීමේ දී ඔබ මේ පිළිබඳව සැළකිලිමත් විය යුතුයි.

- පන් නෙළීමේ ක්‍රියාවලිය ඉස්මතු වන පරිදි උචිත චලන තෝරා ගැනීම.
- නැටුමට උචිත සරල පද නිර්මාණය කිරීම.
- විවිධ තාලවලට කවි, බෙර පද යොදා ගැනීම මඟින් කලාත්මක නිර්මාණයක් ඉදිරිපත් කිරීම.
- හැඩතල , රංග රටා , මෝස්තර භාවිත කිරීම.
- අවකාශ භාවිතය සැළකිල්ලට ගැනීම.
- නර්තනයට අදාල උපකරණ නිවැරදිව භාවිත කිරීම.

ඉහත කරුණු සැළකිල්ලට ගෙන නර්තන නිර්මාණයේ දී මෙම ක්‍රියාකාරකම් අන්තර්ගත කර ගැනීමට ඔබට හැකිය.

- පන් නෙලීමට යැමට සැරසීම.
- පන් නෙලීමට යැම.
- පන් නෙලීමට විලට බැසීම.
- පන් නෙලීම / පන් කැපීම.
- පන් හැලීම හා පන් රැගෙන ඒම.
- පන් වේලීම හා මැදීම.
- පන් විවීම.

ක්‍රියාකාරකම 1

1. ගැමි නැටුම් හඳුන්වන්න.

2. ගැමි නැටුම් වල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ මොනවාද?

3. පන් නෙලීමේ නැටුමෙහි සංස්කෘතික පසුබිම හඳුන්වන්න.

4. පන් නෙලීමේ නැටුමෙහි සුවිශේෂ ලක්ෂණ 3 ක් නම් කරන්න.



## ගොයම් කැපීමේ නැටුම



කෘෂිකාර්මික ජන සමාජයක් තුළ ජීවත් වූ මිනිසා තම වෘත්තීය ලෙස වී ගොවිතැන යොදාගෙන ඇත.මෙම කාර්යෙහි යෙදෙන ගොවියා තම ශරීරයට දැනෙන වෙහෙස , මහන්සිය , විඩාව , පාළුව මඟ හරවා ගැනීම පිණිස ගොයම් කැපීමේ කවි ගායනා කරන ලදී.මෙහිදී සිදු කරන ක්‍රියාකාරකම් අලළා විනෝදාස්වාදය අරමුණු කර ගෙන විවිධ හැඩතල , රටා මතු කරමින් ගොයම් කැපීමේ නර්තනය නිර්මාණය කර ගෙන ඇත.සාමූහික ගැමි නැටුමක් වන මෙය වර්තමානයේ ප්‍රසංග වේදිකාවට උචිත පරිදි නිර්මාණය කර ගෙන ඇත.


ගැමි සමාජයේ දක්නට ලැබෙන ගැමි සාරධර්ම මෙන්ම ඔවුන් තුල පවතින විශ්වාස ද මේ කවි වලින් ඉස්මතු වේ.ගොයම් කැපීමට **වක් දැත්ත** භාවිත කළ අතර ගොයම් කැපීමේ දී ගායනාවන්ගේ තාල රූපයට අනුව වාදනය කිරීමට **බුම්මැඩිය** නමින් එක් උරහිසක එල්ලා වාදනය කරන භාණ්ඩයක් යොදා ගෙන ඇත.

| | |
|---|---|
| උදේ සිටන් වකුටු කොන්ද දිග | හැරපල්ලා |
| අතේ තියෙන ගොයම් මිටිය බිම | දමපල්ලා |
| හිසේ තියෙන ලේන්සු පොඩිය අතට | ගනිල්ලා |
| සතර වරම් දෙවි පිහිටෙන් ගොඩ | පලයල්ලා |

| | |
|---|---|
| ඉරු දෙවියන්ගේ ඉර ගල | ගාවා |
| සඳ දෙවියන්ගේ සඳ ගල | ගාවා |
| ගණ දෙවියන්ගේ කෝවිල | ගාවා |
| අපිත් කියමු කවි ගොවිපල | ගාවා |

| | |
|---|---|
| රන් දැකැති ගෙන නිති | සැරසෙනවා |
| රත්රන් පටි ඉණවට | දිලිසෙනවා |
| රිවි දුටු පිනි බිඳු ලෙස | පහවෙනවා |
| දුම්බර කෙතෙ අපි ගොයම් | කපනවා |

| | |
|---|---|
| එපා කියන තැන තැන | නොසිටිල්ලා |
| පිපාස නම් දියවර | බීපල්ලා |
| අපාසු නම් සෙවනේ | සිටපල්ලා |
| කපා ගොයම් කඩිනම් | කරපල්ලා |



**බුම්මැඩිය**

ගොයම් කැපීමේ නැටුම නිර්මාණය කිරීමේ දී ඔබ මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ.

- **සුවිශේෂ ලක්ෂණ ඉස්මතු වන පරිදි චලන තෝරා ගැනීම.**
- **ගොයම් කැපීමට උචිත පරිදි සරල පද නිර්මාණය කරීම.**
- **දැකැත්ත නිවැරදිව හසුරවමින් ගොයම් කැපීමේ ස්වභාවය විදහා දැක්වෙන පරිදි නර්තනය කිරීම.**
- **තෝරා ගත් කවි වල ගති ලක්ෂණ ඉරියව් මඟින් විදහා පෑම.**
- **රටා , හැඩතල යොදා ගෙන අවකාශය භාවිත කරමින් ප්‍රාසාංගික නර්තනයක් ඉදිරිපත් කිරීම.**

මේ කරුණු සැළකිල්ල්ට ගෙන නර්තන නිර්මාණය කිරීමේ දී මෙම ක්‍රියාකාරකම් අන්තර්ගත කර ගැනීමට ඔබට හැකියි.

- කෙතට පැමිණෙන ආකාරය.
- හිසට රෙදිකඩ දමා කෙතට බැසීම.
- ගොයම් කැපීම
- බුම්මැඩිකරුවන්ගේ වාදන සමඟින් අස්වැන්න නෙලීමේ සතුට පළ කිරීම.
- දියවර බීම.
- ගොයම් මිටි බැඳ රැගෙන යාම හා කෙතෙන් ගොඩ ඒම.

ක්‍රියාකාරකම 2

1. ගොයම් කැපීමේ නැටුම හඳුන්වන්න.
2. එහි සුවිශේෂ ලක්ෂණ 3 ක් ලියන්න.
3. නර්තන නිර්මාණයේදී යොදා ගත හැකි ක්‍රියාකාරකම් 5 ක් ලියන්න.
4. මෙම කවි සියල්ල මතකයෙන් ගායනා කිරීමට පාඩම් කරන්න.

ඉතිං දුවේ පුතේ පන් නෙලීමේ නැටුම හා ගොයම් කැපීමේ නැටුම ප්‍රායෝගිකව ඔබගේ ගුරුවරයා සමඟ අභ්‍යාස කළ යුතු පාඩමක්.එබැවින් ඉහත කරුණු සියල්ලම සැළකිල්ලට ගෙන ඔබගේ පාසලේ ගුරුවරයාගේ සහාය ඇතුව මෙම නැටුම් නිර්මාණය කර ගන්න.

සැකසුම - **H. S. V. S. H.** දංගොල්ල බණ්ඩාර ර/ නිවි/ පැබොටුව මහා විද්‍යාලය
පැබොටුව